සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

02 S I

තෙවන වාර පරීක්ෂණය - 12 ශ්‍රේණිය - 2018

# Third Term Test - Grade 12 - 2018

විභාග අංකය ............................ රසායන විද්‍යාව I කාලය පැය දෙකයි

**සැලකිය යුතුයි**

- මෙම ප්‍රශ්න පත්‍රය සමග ආවර්තිතා වගුවක් සපයා ඇත.
- ගණක යන්ත්‍ර භාවිතයට ඉඩ දෙනු නොලැබේ.
- සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- උත්තර පත්‍රයේ නියමිත ස්ථානයේ ඔබේ විභාග අංකය ලියන්න.
- 1 සිට 50 තෙක් වූ එක් එක් ප්‍රශ්නයට (1), (2), (3), (4), (5) යන පිළිතුරුවලින් නිවැරදි හෝ ඉතාමත් ගැළපෙන හෝ තෝරාගෙන , එය උත්තර පත්‍රයේ පිටුපස දැක්වෙන උපදෙස් පරිදි කතිරයක් යොදා දක්වන්න.

සාර්වත්‍ර වායු නියතය $R = 8.314\ J\ mol^{-1}K^{-1}$ / ඇවගාඩ්රෝ නියතය $N_A = 6.022 \times 10^{23}\ mol^{-1}$ /ප්ලාන්ක් නියතය $h = 6.626 \times 10^{-34}\ JS$ / ආලෝකයේ ප්‍රවේගය $C = 3 \times 10^8\ mS^{-1}$

---

1. පරමාණුව පිළිබඳව රදර්ෆර්ඩ් ගේ ග්‍රහ ආකෘතිය හා වඩාත් සමීප සම්බන්ධතාවයක් දැක්වෙන විද්‍යාඥයා වනුයේ,
   1. ඩෝල්ටන් ය.
   2. මිලිකන් ය.
   3. මාස්ඩන් ය.
   4. චැඩ්වික් ය.
   5. ඩි - බ්‍රෝග්ලි ය.

2. $N^{3-}$ , $O^{2-}$ , $F^-$ , $Na^+$ හා $Mg^{2+}$ හි අරය **වැඩිවන නිවැරදි** අනුපිළිවෙල වනුයේ,
   1. $N^{3-} < O^{2-} < F^- < Na^+ < Mg^{2+}$
   2. $F^- < O^{2-} < N^{3-} < Mg^{2+} < Na^+$
   3. $N^{3-} < O^{2-} < F^- < Mg^{2+} < Na^+$
   4. $F^- < O^{2-} < N^{3-} < Na^+ < Mg^{2+}$
   5. $Mg^{2+} < Na^+ < F^- < O^{2-} < N^{3-}$

3. පහත සංයෝගයේ IUPAC නාමය වනුයේ,




   1. 5-bromohex-3-ene-2-ol
   2. 5-bromohex-3-en-2-ol
   3. 5-bromohex-3-ene 2-ol
   4. 2-bromo-5-hydroxyhex – 3- ene
   5. 5-bromo-2-hydroxyhex-3-ene

4. ${}^{18}_{8}O_2^{2-}$ අයනයේ ඇති ඉලෙක්ට්‍රෝන, නියුට්‍රෝන හා ප්‍රෝටෝන සංඛ්‍යා පිළිවෙලින් වනුයේ,
   1. 20, 16, 20
   2. 20, 20, 16
   3. 18, 20, 16
   4. 10, 10, 8
   5. 20, 36, 16

**5.** කිසියම් පරමාණුවක ක්වොන්ටම් අංක සම්බන්ධයෙන් පහත කුමන වගන්තිය **අසත්‍ය වේද?**

1. n = 3 හා $m_l = +1$ වන පරිදි පැවතිය හැකි කාක්ෂික ගණන 2 කි.
2. උද්දිගාංශ ක්වොන්ටම් අංකය $l$ වන උපශක්ති මට්ටමෙහි පැවතිය හැකි කාක්ෂික ගණන $2l + 1$ වේ.
3. ශුන්‍ය ද ඇතුළුව $-l$ සිට $+l$ දක්වා පූර්ණ සංඛ්‍යාවක් $ml$ සඳහා පැවතිය හැක.
4. $m_l$ සඳහා පැවතිය හැකි අගයන් ගණන $l$ හි අගයට අනුලෝමව සමානුපාතික නොවේ.
5. $n = 4$ හා $m_l = -2$ වන පරිදි පැවතිය හැකි කාක්ෂික ගණන 4 කි.

6. පහත කරුණු අතරින් දායක සහසංයුජ බන්ධනයක් **නොමැති** අණුව වන්නේ,

1. $NO_2F$ 2. $NO_2$ 3. $N_2O_4$ 4. $NO_3^-$ 5. $NO_2^-$

7. එතනෝල් හා ජලය මිශ්‍රණයක එතනෝල් හි මවුල භාගය 0.2 වීම සඳහා ජලය $1kg$ සමඟ මිශ්‍ර කළ යුතු එතනෝල් ස්කන්ධය වනුයේ, (සා.ප.ස්. H = 1, C = 12, O = 16) (ජලයේ ඝනත්වය $1g/cm^3$)

1. 92 $g$ 2. 638.8$g$ 3. 833.25$g$ 4. 200$g$ 5. 13.89 $g$

8. $C\ mol\ dm^{-3}$ සාන්ද්‍රණයෙන් යුත් ආම්ලික $KMnO_4$ ද්‍රාවණයකින් $V_1$ පරිමාවක් සමඟ සම්පූර්ණයෙන් ප්‍රතික්‍රියා කිරීමට එක්තරා හයිඩ්‍රජන් පෙරොක්සයිඩ් ද්‍රාවණයකින් $V_2$ පරිමාවක් අවශ්‍ය විය. හයිඩ්‍රජන් පෙරොක්සයිඩ් ද්‍රාවණයේ සාන්ද්‍රණය වනුයේ,

1. $2CV_1\ /\ 5\,V_2$ 2. $5\,CV_1\ /\ 2\,V_2$ 3. $2CV_1\ /\ 3\,V_2$
4. $CV_1/\,(\,V_1 +\ V_2\,)$ 5. ගණනය සඳහා ප්‍රමාණවත් දත්ත සපයා නැත.

9. S ගොනුවේ මූලද්‍රව්‍ය සම්බන්ධයෙන් මින් කුමන වගන්තිය **සත්‍ය වේද?**

1. පළමු කාණ්ඩයේ කාබනේට තාපය හමුවේ වියෝජනය නොවේ.
2. $MgH_2$ හි ජලීය ද්‍රාවනයක් උදාසීන වේ.
3. $LiNO_3$ හි වියෝජනයෙන් ඔක්සිජන් වායුව ලැබේ.
4. කාබනේට සියල්ල ජලයේ අද්‍රාව්‍ය වේ.
5. දෙවන කාණ්ඩයේ හයිඩ්‍රොක්සයිඩ සියල්ල ජලයේ අද්‍රාව්‍ය වේ.

10. $OCN^-$ අයනය සඳහා පැවතිය හැකි සම්ප්‍රයුක්ත ව්‍යුහ ගණන වනුයේ, (සැකිල්ල O – C - N)

1. 1 2. 2 3. 3 4. 4 5. 5

11. ද්විතියික අන්තර් ක්‍රියා සම්බන්ධයෙන් පහත කුමන වගන්තිය **සත්‍ය වේද?**

1. සමහර අණු අතර පවත්නා අපකිරණ බල ද්විධ්‍රැව ආකර්ෂණවලට වඩා ප්‍රබල විය හැක.
2. $NaCl$ ජලයේ දියවන්නේ ජලය සමඟ $H$ බන්ධන සෑදීම නිසාය.
3. නිර්ධ්‍රැවීය අණු අතර පමණක් ලන්ඩන් අපකිරණ බල පවතී.
4. $I_2$ ජලයේ මඳ වශයෙන් ද්‍රාව්‍ය වන්නේ අයන - ප්‍රේරිත ද්විධ්‍රැව ආකර්ෂණ නිසාය.
5. අයනික සංයෝගයක අනුක ස්කන්ධය වැඩිවත්ම අයන අතර පවත්නා වැන්ඩවාලස් ආකර්ෂණ ප්‍රබලවේ.

12. පහත එන්තැල්පි සම්බන්ධතාවලින් **සත්‍ය වන්නේ,**

1. $\Delta H_f^\theta$ (CO$_{(g)}$) = $\frac{1}{2}\,\Delta H_f^\theta$ ($CO_{2\ (g)}$)
2. $\Delta H_f^\theta$ (CO$_{(g)}$) = $\Delta H_c^\theta$ (C , graphite) - $\Delta H_c^\theta$ (CO$_{(g)}$)
3. $\Delta H_f^\theta$ (CO$_{(g)}$) = $\Delta H_f^\theta$ (C , graphite) + $\frac{1}{2}\,\Delta H_f^\theta$ ($O_{2\ (g)}$)
4. $\Delta H_f^\theta$ (CO$_{(g)}$)= $\Delta H_f^\theta$ ($CO_{2(g)}$) - $\frac{1}{2}\,\Delta H_f^\theta$ ($O_{2\ (g)}$)
5. ඉහත සියල්ල අසත්‍යය.

13. දක්වා ඇති ප්‍රස්ථාරයහි $A, B, C, D$ වායූන් පිළිවෙලින්,




1. $CH_4$ , $H_2$ , $He$ , $NH_3$
2. $CH_4$ , $He$ , $NH_3$ , $H_2$
3. $H_2$ , $CH_4$ , $NH_3$ , $He$
4. $CH_4$ , $He$ , $H_2$ , $NH_3$
5. $CH_4$ , $H_2$ , $NH_3$ , $He$

14. සංවෘත දෘඪ භාජනයක් තුල $300K$ දී $NH_3$ හා $N_2H_4$ වායූන් තබා ඇති විට එහි පීඩනය $0.6\,atm$ වේ. උෂ්ණත්වය $1000K$ දක්වා වැඩිකල විට පහත ප්‍රතික්‍රියාව අනුව $NH_3$ හා $N_2H_4$ සම්පූර්ණයෙන් වියෝජනය වේ.

$2\,NH_3(g) \rightarrow N_{2(g)} + 3\,H_2\,(g)$

$N_2H_4\,(g) \rightarrow N_{2(g)} + 2\,H_{2\,(g)}$

මෙහිදී මුළු පීඩනය $4.8\,atm$ දක්වා වැඩිවුණි නම් ආරම්භක මිශ්‍රණයේ $NH_3$ හි මවුල ප්‍රතිශතය,

1. 40%   2. 50%   3. 60%   4. 70%   5. 80%

15. සටනා ගුණයකට උදාහරණයක් වන්නේ,

1. ස්කන්ධය   2. ඝනත්වය   3. පරිමාව
4. තාප ධාරිතාව   5. ආරෝපණය

16. $aH^+ + b\ Cr_2O_7^{2-} + c\,SO_2 \rightarrow$ ඵල

යන ප්‍රතික්‍රියාවේ $a, b$ හා $c$ හි අගයන් පිළිවෙලින්,

1. 10,2,3   2. 26,6,2   3. 2,1,3   4. 13,3,1   5. 5,1,3

17. $H_2O\,(g)$ හි සම්මත උත්පාදන එන්තැල්පිය $-249\,kJ\,mol^{-1}$ වේ. $H-H$ හා $O=O$ සම්මත බන්ධන විඝටන එන්තැල්පි පිළිවෙලින් $433\,kJ\,mol^{-1}$ හා $492\,kJ\,mol^{-1}$ වේ. $O-H$ හි සම්මත මධ්‍යන්‍ය බන්ධන විඝටන එන්තැල්පිය වනුයේ,

1. $676\ kJ\,mol^{-1}$   2. $464\ kJ\,mol^{-1}$   3. $-464\ kJ\,mol^{-1}$
4. $232\,kJ\,mol^{-1}$   5. $-232\ kJ\,mol^{-1}$

18. $1\,mol\,dm^{-3}\ KOH,\ 25\,cm^3$ හා $1\,mol\,dm^{-3}\,HNO_3\,25\,cm^3$ කැලරී මිටරයක් තුල මිශ්‍ර කල විට උෂ්ණත්වය $5\ ^0C$ වලින් වැඩිවුණි නම් එහිදී සිදුවූ එන්තැල්පි විපර්යාසය වනුයේ, (ජලයේ ඝනත්වය $1g/cm^3$ / ජලයේ වි.තා.ධා. $4.2\,J\,g^{-1}\ ^0C^{-1}$)

1. $+42\ kJ\,mol^{-1}$   2. $-42\ kJ\,mol^{-1}$   3. $+1.05\ kJ\,mol^{-1}$
4. $-1.05\ kJ\,mol^{-1}$   5. $-26.25\ kJ\,mol^{-1}$

19. පහත ඒවා අතරින් **සත්‍ය වන්නේ** මොනවාද?

1. ඇල්කිල් හේලයිඩවල නියුක්ලියෝෆිලික ආදේශ ප්‍රතික්‍රියාවලට ලක්වීමේ ප්‍රවණතාව C –X බන්ධනයේ ධ්‍රැවීය ස්වභාවය මත රඳා පවතී.
2. නියුක්ලියෝෆිලික ප්‍රතිකාරක වලට භස්ම ලෙස හැසිරිය හැක.
3. නියුක්ලියෝෆිලික ආදේශ ප්‍රතික්‍රියා කෙරෙහි ඇරිල් හේලයිඩ අක්‍රියතාවක් දක්වන නමුත් වයිනයිල් ක්ලෝරයිඩ් පහසුවෙන් ප්‍රතික්‍රියා කරයි.
4. ඇල්කිල් හේලයිඩ් දක්වන ප්‍රධාන ප්‍රතික්‍රියාව වන්නේ තරගකාරී ක්‍රියාවක් ලෙසඉවත් වීමයි.
5. $SP^2$ කාබන් පරමාණුවලට සම්බන්ධ හැලජනවල ප්‍රතික්‍රියාශීලීතාවය $SP^3$ කාබන් පරමාණුවලට සම්බන්ධ හැජලනවලට වඩා වැඩිය.

20. බෙන්සීන් නයිට්‍රොකරණයට අදාල යන්ත්‍රණයේ ව්‍යුහයක් **නොවන්නේ,**

(1) 

(2) 

(3) 

(4) 

(5) 

21. 

යන සංයෝගය පිළිබඳව **සත්‍ය ප්‍රකාශය** වන්නේ,

1. සෑම C පරමාණුවක්ම එකම තලයේ නොපවතී.
2. බන්ධන දිග d < b < c < a වේ.
3. සෑම $H$ පරමාණුවක්ම එකම තලයේ පවතී.
4. බන්ධන ශක්තිය d < b < c < a ආකාර වේ.
5. මෙහි $sp$ මුහුම් කාබන් පරමාණු 3ක් පවතී.

22. බ්‍රෝමීන් දියර හා ඇමෝනීය කියුප්‍රස් ක්ලෝරයිඩ් යන ප්‍රතිකාරක දෙකම සමග ප්‍රතික්‍රියා කරන්නේ,

1. $CH_3\,CH = \ CH_2$
2. $CH_3CH_2C\ \equiv\ CH$
3. $CH_3C\ \equiv CCH_3$
4. $CH_3\ \underset{|\atop H}{C} = \underset{|\atop H}{C}\,CH_3$
5. $CH_3CH = \ CHBr$

23. $C_5H_{10}O$ අනුක සූත්‍රය aldehyde සහ ketone සඳහා අදාළ වේ. මේ සඳහා පැවතිය හැකි සමාවයවික ගණන වන්නේ,

1. 4
2. 5
3. 6
4. 7
5. 8

24. මින් ඊතරයක් **වන්නේ,**

1. $CH_3 - O - CH_3$

2. 

3. 

4. 

4. 

25. $Al$ හි රසායනය සම්බන්ධයෙන් **නිවැරදි නොවන්නේ,**

1. $Al$ අඩංගු සංයෝගවල දී Al හි ඔක්සිකරණ අංකය +3 වේ.
2. $Al$ අම්ල සමඟ ප්‍රතික්‍රියා කරයි.
3. $Al$ භස්ම සමඟ පමණක් ප්‍රතික්‍රියා කරයි.
4. $Al$ උභයගුණී මූලද්‍රව්‍යයකි.
5. $AlCl_3$ හි ඉලෙක්ට්‍රෝන ඌනතාවය නිසා $Al_2Cl_6$ ලෙස සකස්වීමකට පෙළඹේ.

26. $0.4\ moldm^{-3}\ HCl$ අම්ලය $25.0\ cm^3$ක් $0.1\ moldm^{-3}\ Ba(OH)_2$ $25.0\ cm^3$ ක් සමඟ මිශ්‍ර කරන ලදී. ද්‍රාවණයේ $H^+$ අයන සාන්ද්‍රණය වනුයේ,

1. $0.2\ M$ 2. $0.1\ M$ 3. $0.3\ M$ 4. $0.05\ M$ 5. 0.15 M

27. $Cl_2$ වායුව වැඩිපුර $NH_3$ සමඟ ප්‍රතික්‍රියාවෙන් ලැබෙන **ඵල වන්නේ,**

1. $N_2(g) + HCl\ (g)$
2. $N_2\ (g) + NH_4Cl$ (s)
3. $NCl_3\ (g) + HCl\ (g)$
4. $NCl_3(g) + NH_4Cl(s)$
5. $N_2(g) + H_2\ (g) + HCl\ (g)$

28. කිසියම් S ගොනුවේ ක්ලෝරයිඩයක් බන්සන් දැල්ලට අල්ලා රත් කිරීමේ දී ලා කොළ පාට දැල්ලක් ලැබුණි. එම ක්ලෝරයිඩයේ අඩංගු ලෝහ අයනය විය හැක්කේ,

1. $Na^+$ 2. $K^+$ 3. $Ca^{2+}$ 4. $Sr^{2+}$ 5. $Ba^{2+}$

29. මෙතනෝල් හි **සම්මත** දහන එන්තැල්පිය $-715\ kJmol^{-1}$ වේ. $71.5\ kJ$ ශක්තියක් නිපදවීම සඳහා දහනය කළයුතු මෙතනෝල් ස්කන්ධයක් වන්නේ,

1. $3.2\ g$ 2. $32\ g$ 3. $71.5\ g$ 4. 715 g 5. $1.6\ g$

30. වායුමය සංයෝගයක ස්කන්ධයෙන් $30.4\%$ ක් $N$ ද, $69.6\%$ ක් ඔක්සිජන් ද ඇත. $27^0C$ උෂ්ණත්වයේ දී හා $1.5 \times 10^5\ Pa$ පීඩනයේ දී මෙම වායුවේ $5.52\ g$ ස්කන්ධයක පරිමාව $1.00\ dm^3$ වේ. සංයෝගයේ අණුක සූත්‍රය වන්නේ,

1. NO 2. $NO_2$ 3. $N_2O_4$ 4. $N_3O_6$ 5. $N_2O_5$

- **අංක 31 සිට 40 තෙක් එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති (a), (b), (c) සහ (d) යන ප්‍රතිචාර හතර අතුරෙන් එකක් හෝ වැඩි සංඛ්‍යාවක් හෝ නිවැරදිය. <u>නිවැරදි ප්‍රතිචාරය / ප්‍රතිචාර</u> කවරේ දැයි තෝරා ගන්න.**

**(a) සහ ( b) පමණක් නිවැරදි නම් ( 1 ) මත ද**
**(b) සහ ( c) පමණක් නිවැරදි නම් ( 2 ) මත ද**
**(c) සහ ( d) පමණක් නිවැරදි නම් ( 3 ) මත ද**
**(a) සහ (d) පමණක් නිවැරදි නම් ( 4 ) මත ද**

වෙනත් ප්‍රතිචාර සංඛ්‍යාවක් හෝ සංයෝජනයක් හෝ නිවැරදි නම් (5) මත ද උත්තර පත්‍රයෙහි දැක්වෙන උපදෙස් පරිදි ලකුණු කරන්න.

ඉහත උපදෙස් සම්පිණ්ඩනය

| 1 | 2 | 3 | 4 | 5 |
|---|---|---|---|---|
| (a) සහ (b) පමණක් නිවැරදියි | (b) සහ (c) පමණක් නිවැරදියි | (c) සහ (d) පමණක් නිවැරදියි | (d) සහ (a) පමණක් නිවැරදියි | වෙනත් ප්‍රතිචාර සංඛ්‍යාවක් හෝ සංයෝජනයක් හෝ නිවැරදියි |

31. පහත වගන්තිවලින් **නිවැරදි වන්නේ,**

a) $Pd$ පරමාණුව පමණක් අවුෆ් බාවු මූලධර්මයෙන් අපගමනය පෙන්වයි.
b) කාක්ෂිකවලට ඉලෙක්ට්‍රෝන පිරෙන්නේ ඒවායේ ශක්තිය ආරෝහණය වන අනුපිළිවෙලටය.
c) සමාන ශක්තිවලින් යුත් කාක්ෂිකවලට ඉලෙක්ට්‍රෝන පිරෙන්නේ ඒවායේ බැමුම් සමාන්තරවන පරදිය.
d) අසම්පූර්ණ s කාක්ෂික හා d කාක්ෂික යන දෙකම පරමාණුවක පැවතිය හැක.

32. සමාන ජ්‍යාමිතියක් ඇති විශේෂ වන්නේ,

a) $IOF_2^+$ b) $NH_3$ c) $XeOF_2$ d) $H_2PO_2^-$

33. වර්ගමධ්‍යනය මූල ප්‍රවේගය සම්බන්ධයෙන් මින් කුමක් **සත්‍ය ද?**

(a) උෂ්ණත්වය දෙගුණයක් කළ විට $\overline{C^2}$ දෙගුණයක් වේ.

(b) පීඩනය දෙගුණයක් කළ විට $\sqrt{\overline{C^2}}$ දෙගුණයක් වේ.

$(c)$ වායුවේ පරිමාව දෙගුණයක් කළ විට $\overline{C^2}$ අර්ධයක් වේ.

$(d)$ දෙන ලද උෂ්ණත්වයක දී $\overline{C^2}$ හි අගය ඕනෑම වායුවක් සඳහා නියතයක් වේ.

34. $NH_3$ සම්බන්ධයෙන් **සත්‍ය වන්නේ,**

(a) අම්ලයක් ලෙස ක්‍රියා කරයි.

(b) දුබල හස්මයක් බැවින් ලෝහ සමඟ ප්‍රතික්‍රියා නොකරයි.

(c) ඔක්සිහාරකයක් වේ.

(d) ඔක්සිකාරකයක් වේ.

35. ජලීය ද්‍රාවණ දම් පැහැති වන්නේ,

(a) $Ti^{4+}\ (aq)$ (b) $Ti^{3+}\ (aq)$ (c) $V^{3+}\ (aq)$ (d) $Cr^{3+}\ (aq)$

36. පහත ප්‍රකාශ වලින් **සත්‍ය වන්නේ**

(a) බොහෝ සංයෝග වල සම්මත දහන එන්තැල්පිය ඍණ අගයකි.

(b) සම්මත තත්ව යටතේ දී ඕනෑම ද්‍රව්‍යයක එන්ට්‍රොපිය ධන අගයකි.

(c) කාබන්හි පරමාණුකරන එන්තැල්පිය ඌර්ධවපාතන එන්තැල්පියට සමාන වේ.

(d) $Br_2$ හි වාෂ්පිකරණ එන්තැල්පිය පරමාණුකරන එන්තැල්පියට සමාන වේ.

37. $2\ mol\ dm^{-3}$ සාන්ද්‍රණයෙන් යුත් $H_2SO_4$ $10\ cm^3$, $2\ mol\ dm^{-3}$ සාන්ද්‍රණයෙන් යුත් $BaCl_2$ $10\ cm^3$ හා $2\ mol\ dm^{-3}$ සාන්ද්‍රණයෙන් යුත් $NaOH$ $10\ cm^3$ එක්කර සාදා ගත් පද්ධතියක,

(a) $Na^+$ හා $Cl^-$ සාන්ද්‍රණ සමානය (b) $Ba^{2+}$ අයන ද්‍රාවණයේ පවතී.

(c) සැදෙන අවක්ෂේප දියවේ. (d) එන්තැල්පි විපර්යාස දෙකක් සිදුවේ.

38. පහත ඒවා අතරින් එතනෝල් සමඟ ප්‍රතික්‍රියා කරනුයේ,

(a) $Na$ (b) $NaOH$ (c) $Na_2CO_3$ (d) $NaHCO_3$

39. 

යන ප්‍රතික්‍රියාවේ ඵල වීමට **අඩුම හැකියාවක් ඇත්තේ,**

a. 


b. 


c. 


d. 

40. තාත්වික වායුවක් සම්බන්ධයෙන් **නිවැරදි වන්නේ,**

(a) ඉහළ උෂ්ණත්වවලදී පරපූර්ණ තත්වයට ලඟා වේ.
(b) ඉහළ පීඩනවල දී පරිපූර්ණ තත්වයට ලඟා වේ.
(c) ඉහළ අණුක ස්කන්ධ ඇති විට පරිපූර්ණ තත්වයට ලඟා වේ.
(d) පහළ පීඩනවල දී පරිපූර්ණ තත්වයට ලඟා වේ.

- **අංක 41 සිට 50 තෙක් එක් ප්‍රශ්නයක් සඳහා ප්‍රකාශ දෙකක් ඉදිරිපත් කර ඇත. එම ප්‍රකාශ යුගලම හොඳින්ම ගැලපෙනුයේ පහත දැක්වෙන පරිදි (1), (2), (3), (4) සහ (5) යන ප්‍රතිචාර වලින් කවර ප්‍රතිචාරය දැයි තෝරා උත්තර පත්‍රයේ උචිත ලෙස ලකුණු කරන්න.**

| ප්‍රතිචාරය | පළමුවැනි ප්‍රකාශය | දෙවැනි ප්‍රකාශය |
|---|---|---|
| 1 | සත්‍යය | සත්‍ය වන අතර පළමු ප්‍රකාශය නිවැරදිව පහදා දෙයි |
| 2 | සත්‍යය | සත්‍ය වන අතර පළමු ප්‍රකාශය නිවැරදිව පහදා නොදේ |
| 3 | සත්‍යය | අසත්‍යය |
| 4 | අසත්‍යය | සත්‍යය |
| 5 | අසත්‍යය | අසත්‍යය |

| | පළමු ප්‍රකාශය | දෙවැනි ප්‍රකාශය |
|---|---|---|
| 41. | ඉලෙක්ට්‍රෝනවල තරංගමය හා අංශුමය ද්විත්ව ස්භාවය විස්තර කිරීමට ඩී-බ්‍රෝග්ලි සමීකරණය භාවිතා කළ හැක. | ඉලෙක්ට්‍රෝනවල ද්විත්ව ස්වභාවය හා ගුණ පිළිබඳව අධ්‍යනය කිරීමට කැතෝඩ කිරණවල විවර්තනය හා නිරෝධනයට අදාල නිරීක්‍ෂණ භාවිතා කල හැක. |
| 42. | ප්‍රබල හස්මයක් හමුවේ කොළ පැහැති $[Ni(H_2O)_6]^{2+}$ අයන ද්‍රාවණය කොළ පැහැති අවක්ෂේපයක් ලබා දේ. | $Ni(OH)_2$ ඝනය කොළ පැහැතිය. |
| 43. | ප්‍රතික්‍රියාවක ගිබ්ස් ශක්ති වෙනස ගණනය සඳහා $\Delta G = \Delta H - T\Delta S$ යන සමීකරණය භාවිතා කළ හැක. | $\Delta H > 0$ හා $\Delta S < 0$ වන විට පහළ උෂ්ණත්වවලදී පමණක් ප්‍රතික්‍රියාවක් ස්වයංසිද්ධ වේ. |
| 44. | $Mn_2O_3$ ට සාපේක්ෂව $Mn_2O_7$ හි ආම්ලිකතාව වැඩිය. | $Mn$ හි ඔක්සිකරණ අංකය වැඩිවත්ම $Mn$ හා $O$ අතර විද්‍යුත් ඍණතා වෙනස වැඩිවී ආම්ලික ගුණ වැඩිවේ. |
| 45. | $HOCH_2CHO$ සහ ග්‍රීනාඩ් ප්‍රතිකාරකය $(CH_3MgBr)$ අතර ප්‍රතික්‍රියාවෙන් $HOCH_2CH\,(CH_3)OMgBr$ ලබා ගත හැක. | ග්‍රීනාඩ් ප්‍රතිකාරකයේ Mg ට සම්බන්ධ C ට නියුක්ලියෝෆයිලයක් ලෙස ක්‍රියා කළ හැක. |
| 46. | $S - S$ හා $S - P$ කාක්ෂිකවල රේඛීය අතිච්ඡාදනයෙන් පමණක් $\sigma$ බන්ධන සෑදේ. | $P$ කාක්ෂික දෙකක් අතර පාර්ශවික අතිච්ඡාදනයෙන් $\pi$ බන්ධන සෑදේ. |
| 47. | අවධි උෂ්ණතත්වයට ඉහළ උෂ්ණත්වවල දී කෙතරම් ඉහළ පීඩනයක් යෙදුවත් වායුවක් ද්‍රව බවට පත් කළ නොහැක. | නියත පීඩනයක හා නියත පරිමාවක ඇති ඕනෑම වායුවක අවධි උෂ්ණත්වය එකම අගයක් ගනී. |
| 48. | ආම්ලික මාධ්‍යයේ දී $Cr_2O_7^{2-}$ අයන $CrO_4^{2-}$ අයන බවට ඔක්සිකරණය වේ. | $Cr_2O_7^{2-}$ හා $CrO_4^{2-}$ යන අයනවල දී $Cr$ හි ඔක්සිකරණ අංකය $+6$ වේ. |
| 49. | $CH_3CH_2Br$ හා $NaOH$ අතර ප්‍රතික්‍රියාව පියවර දෙකක් ඔස්සේ සිදුවේ. | නව බන්ධන තැනීම, බන්ධන බිඳීමෙන් පසුව සිදුවන විට, ඇල්කිල් හේලයිඩවල නියුක්ලියෝෆිලික ආදේශය දෙපියවර ප්‍රතික්‍රියාවක් වේ. |
| 50. | ප්‍රාථමික ඇල්කොහොල මෙන්ම ද්විතීක ඇල්කොහොල ද ඔක්සිකරණය සඳහා $PCC$ භාවිතා කළ හැක. | ඇල්කොහොලයක $OH$ කාණ්ඩය සම්බන්ධ $C$ මත $H$ පිහිටා ඇත්නම් පමණක් එම ඇල්කොහොලය ඔක්සිකරණය වේ. |

# ආවර්තිතා වගුව
## ஆவர்த்தன அட்டவணை
## Periodic Table

| | | | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | 1<br>H | | | | | | | | | | | | | | | | | 2<br>He |
| 2 | 3<br>Li | 4<br>Be | | | | | | | | | | | 5<br>B | 6<br>C | 7<br>N | 8<br>O | 9<br>F | 10<br>Ne |
| 3 | 11<br>Na | 12<br>Mg | | | | | | | | | | | 13<br>Al | 14<br>Si | 15<br>P | 16<br>S | 17<br>Cl | 18<br>Ar |
| 4 | 19<br>K | 20<br>Ca | 21<br>Sc | 22<br>Ti | 23<br>V | 24<br>Cr | 25<br>Mn | 26<br>Fe | 27<br>Co | 28<br>Ni | 29<br>Cu | 30<br>Zn | 31<br>Ga | 32<br>Ge | 33<br>As | 34<br>Se | 35<br>Br | 36<br>Kr |
| 5 | 37<br>Rb | 38<br>Sr | 39<br>Y | 40<br>Zr | 41<br>Nb | 42<br>Mo | 43<br>Tc | 44<br>Ru | 45<br>Rh | 46<br>Pd | 47<br>Ag | 48<br>Cd | 49<br>In | 50<br>Sn | 51<br>Sb | 52<br>Te | 53<br>I | 54<br>Xe |
| 6 | 55<br>Cs | 56<br>Ba | La-<br>Lu | 72<br>Hf | 73<br>Ta | 74<br>W | 75<br>Re | 76<br>Os | 77<br>Ir | 78<br>Pt | 79<br>Au | 80<br>Hg | 81<br>Tl | 82<br>Pb | 83<br>Bi | 84<br>Po | 85<br>At | 86<br>Rn |
| 7 | 87<br>Fr | 88<br>Ra | Ac-<br>Lr | 104<br>Rf | 105<br>Db | 106<br>Sg | 107<br>Bh | 108<br>Hs | 109<br>Mt | 110<br>Uun | 111<br>Uuu | 112<br>Uub | 113<br>Uut | | | | | |

| | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 57<br>La | 58<br>Ce | 59<br>Pr | 60<br>Nd | 61<br>Pm | 62<br>Sm | 63<br>Eu | 64<br>Gd | 65<br>Tb | 66<br>Dy | 67<br>Ho | 68<br>Er | 69<br>Tm | 70<br>Yb | 71<br>Lu |
| 89<br>Ac | 90<br>Th | 91<br>Pa | 92<br>U | 93<br>Np | 94<br>Pu | 95<br>Am | 96<br>Cm | 97<br>Bk | 98<br>Cf | 99<br>Es | 100<br>Fm | 101<br>Md | 102<br>No | 103<br>Lr |

සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education NWP වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education - NWP

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

| 02 | S | II |
|---|---|---|

## තෙවන වාර පරීක්ෂණය - 12 ශ්‍රේණිය - 2018
## Third Term Test - Grade 12 - 2018

විභාග අංකය ............................ **රසායන විද්‍යාව II** කාලය පැය තුනයි

* ආවර්තිතා වගුවක් අවසාන පිටුවෙහි සපයා ඇත.
* **ගණක යන්ත්‍ර භාවිතයට ඉඩ දෙනු නොලැබේ.**
* සාර්වත්‍ර වායු නියතය, $R = 8.314\ J\ K^{-1}\ mol^{-1}$
* ඇවගාඩ්රෝ නියතය, $N_A = 6.022 \times 10^{23}\ mol^{-1}$

□ **A කොටස - ව්‍යුහගත රචනා**

* **සියලු ම** ප්‍රශ්නවලට මෙම ප්‍රශ්න පත්‍රයේ ම පිළිතුරු සපයන්න.
* ඔබේ පිළිතුරු එක් එක් ප්‍රශ්නයට ඉඩ සලසා ඇති තැන්වල ලිවිය යුතු ය. මේ ඉඩ ප්‍රමාණය පිළිතුරු ලිවීමට ප්‍රමාණවත් බව ද දීර්ඝ පිළිතුරු බලාපොරොත්තු නො වන බව ද සලකන්න.

□ **B කොටස සහ C කොටස - රචනා**

* එක් එක් කොටසින් ප්‍රශ්න **දෙක** බැගින් තෝරා ගනිමින් ප්‍රශ්න **හතරකට** පිළිතුරු සපයන්න. මේ සඳහා සපයනු ලබන කඩදාසි භාවිත කරන්න.
* සම්පූර්ණ ප්‍රශ්න පත්‍රයට නියමිත කාලය අවසන් වූ පසු **A**, **B** සහ **C** කොටස්වලට පිළිතුරු, **A** කොටස මුලින් තිබෙන පරිදි එක් පිළිතුරු පත්‍රයක් වන සේ අමුණා විභාග ශාලාධිපතිට භාර දෙන්න.
* ප්‍රශ්න පත්‍රයෙහි **B** සහ **C** කොටස් **පමණක්** විභාග ශාලාවෙන් පිටතට ගෙන යා හැකි ය.

**පරීක්ෂකවරුන්ගේ ප්‍රයෝජනය සඳහා පමණි**

| කොටස | ප්‍රශ්න අංකය | ලැබූ ලකුණු |
|---|---|---|
| A | 1 | |
| | 2 | |
| | 3 | |
| | 4 | |
| B | 5 | |
| | 6 | |
| | 7 | |
| C | 8 | |
| | 9 | |
| | 10 | |
| එකතුව | | |
| ප්‍රතිශතය | | |

**අවසාන ලකුණු**

| | |
|---|---|
| ඉලක්කමෙන් | |
| අකුරින් | |

**සංකේත අංක**

| | |
|---|---|
| උත්තර පත්‍ර පරීක්ෂක 1 | |
| උත්තර පත්‍ර පරීක්ෂක 2 | |
| පරීක්ෂා කළේ : | |
| අධීක්ෂණය කළේ : | |

[දෙවැනි පිටුව බලන්න.

## A කොටස - ව්‍යුහගත රචනා

(01) a. I. මෙතිල් නයිට්‍රේට් යනු නයිට්‍රික් අම්ලයේ මෙතිල් එස්ටරයකි. එහි රසායනික සූත්‍රය $CH_3NO_3$ වේ. එය අවර්ණ වාෂ්පශීලී ද්‍රවයක් වන අතර එය පුපුරන සුලුය.
එහි සැකිලි ව්‍යුහය පහත දී ඇත.



i. මෙතිල් නයිට්‍රේට් $(CH_3NO_3)$ සඳහා වඩාත් පිළිගත හැකි ලුවිස් ව්‍යුහය අඳින්න.

ii. මෙම අණුව සඳහා සම්ප්‍රයුක්ත ව්‍යුහ ඇඳ ඒවායේ සාපේක්ෂ ස්ථායිතාවය පිළිබඳ අදහස් දක්වන්න.

iii. ආසන්න බන්ධන කෝණ දක්වමින් ඉහත (i) කොටසෙහි අඳින ලද ලුවිස් ව්‍යුහයේ දළ සටහනක් අඳින්න.

II. පහත සඳහන් උපකල්පිත ලුවිස් ව්‍යුහය පදනම් කරගෙන පහත වගුවේ දක්වා ඇති පරමාණුවල,

i. පරමාණුව වටා ඉලෙක්ට්‍රෝන යුගල ජ්‍යාමිතිය
ii. පරමාණුව වටා හැඩය
iii. පරමාණුවේ මුහුම්කරණය සඳහන් කරන්න.



| | | $N$ පරමාණුව | $Cl$ හා $N$ යන දෙකටම බැඳුන $O$ පරමාණුව |
|---|---|---|---|
| i | ඉලෙක්ට්‍රෝන යුගල ජ්‍යාමිතිය | | |
| ii | හැඩය | | |
| iii | මුහුම්කරණය | | |

(b) පහත දී ඇති ලුවිස් ව්‍යුහයන්හි පහත සඳහන් $\sigma$ බන්ධන සෑදීමට සහභාගිවන පරමාණුක / මුහුම්කාක්ෂික හඳුනාගන්න.



i. N① — N② ; N① ........................................ N② ........................................

ii. N① — H ; N① ........................................ H ........................................

(c) $Xe$ , $I_3^-$ , $CH_4$ , ජලීය $NaCl$ , $HF$
ඉහත දක්වා ඇති ද්‍රව්‍ය අතරින් කුමන එක / ඒවාට පහත දක්වා ඇති බල තිබේද?

i. අයන - ප්‍රේරිත ද්විධ්‍රැව බල ........................................

ii. අයන - ද්විධ්‍රැව බල - ........................................

iii. ලන්ඩන් අපකිරණ බල - ........................................

iv. හයිඩ්‍රජන් බන්ධන බල - ........................................

(02) (a) $A$ සිට $E$ දක්වා ලේබල් කර ඇති පරීක්ෂණ නලවල පහත සඳහන් ඝන ද්‍රව්‍ය අඩංගු වේ. (පිළිවෙලින් නොවේ.)

$KNO_3$, $(NH_4)_2CO_3$ , $LiNO_3$ ,$(NH_4)_2Cr_2O_7$ , $NH_4NO_2$

මේ එක් එක් ඝන ද්‍රව්‍යය රත් කළ විට සෑදෙන ඵල පිළිබඳ විස්තරයක් පහත වගුවේ දැක්වේ.

| **ඝන ද්‍රව්‍යය** | **විස්තරය** |
|---|---|
| A | • කොළ පැහැති කුඩක්<br>• කාමර උෂ්ණත්වයේ දී අවර්ණ ද්වි පරමාණුක වායුවක්<br>• ජල වාෂ්ප |
| B | • ජලය සමඟ ප්‍රතික්‍රියා කර භාෂ්මික ද්‍රාවණයක් සාදන සුදු පැහැති ඔක්සයිඩයක්<br>• කාමර උෂ්ණත්වයේ දී අවර්ණ ද්වි පරමාණුක වායුවක්<br>• රතු - දුඹුරු වායුවක් |
| C | • වායුමය අවස්ථාවේ ඇති ඵල තුනක් |
| D | • සුදු කුඩක්<br>• කාමර උෂ්ණත්වයේ දී අවර්ණ ද්වි පරමාණුක වායුවක් |
| E | • වායුමය අවස්ථාවේ ඇති ඵල දෙකක් |

(i) A සිට E දක්වා ඝන ද්‍රව්‍ය හඳුනාගන්න.

A ........................................ B ........................................
C ........................................ D ........................................
E ........................................

(ii) A සිට E දක්වා එක් එක් ඝන ද්‍රව්‍ය රත් කිරීමේ දී සිදුවන ප්‍රතික්‍රියා සඳහා තුලිත රසායනික සමීකරණ ලියන්න. (ප්‍රතික්‍රියක සහ ප්‍රතිඵල වල භෞතික අවස්ථා දක්වා තිබිය යුතුය.)

.................................................................................................................................................

.................................................................................................................................................

.................................................................................................................................................

.................................................................................................................................................

.................................................................................................................................................

.................................................................................................................................................

(II) $C$ ඝනය රත්කිරීමේ දී පිටවූ වායුන් තුන හඳුනාගැනීම සඳහා සරළ පරීක්ෂණයක් බැගින් ලියන්න.

| **වායුමය ඵලය** | **පරීක්ෂණය** |
|---|---|
| | |
| | |
| | |

(b)(I) A මූල ද්‍රව්‍යයේ අනුයාත අයණීකරණ ශක්තීන් පහත වගුවේ දක්වා ඇත.

| | $IE_1$ | $IE_2$ | $IE_3$ | $IE_4$ | $IE_5$ |
|---|---|---|---|---|---|
| අයණීකරණ ශක්තිය / $kJmol^{-1}$ | 578 | 1811 | 2745 | 11540 | 14842 |

(i) හේතු දක්වමින් A මූලද්‍රව්‍ය අයත් කාණ්ඩය හඳුනාගන්න.

.................................................................................................................................................

.................................................................................................................................................

(ii) $A$ මූල ද්‍රව්‍ය $HCl$ සමඟ මෙන්ම $NaOH$ සමඟ ද ප්‍රතික්‍රියා කරයි. $A$ හි ක්ලෝරයිඩය ද්විඅවයවිකයක් වශයෙන් පවතී.
$A$ මූලද්‍රව්‍ය හඳුනාගන්න.

.................................................................................................................................................

(iii) $A$ හි ක්ලෝරයිඩයේ ව්‍යුහය අඳින්න.

(iv) එය ද්විඅවයවිකයක් වශයෙන් පවතින්නේ මන්දැයි විස්තර කරන්න.

.................................................................................................................................................

.................................................................................................................................................

.................................................................................................................................................

.................................................................................................................................................

(v) A හි පහත ප්‍රතික්‍රියා සඳහා තුලිත රසායනික සමීකරණ ලියන්න

HCl සමඟ ...................................................................................................................................................

NaOH සමඟ ................................................................................................................................................

(II) (i) පහත න්‍යෂ්ඨික ප්‍රතික්‍රියාව සම්පූර්ණ කරන්න.

$^{56}_{26}Fe \ + \ ^{1}_{2}H \ \rightarrow \ ^{4}_{2}\alpha \ + \ ^{\cdots}_{\cdots} X$

(ii) $H_2S\ (g)$ හා $D_2S\ (g)$ එකිනෙකින් වෙන්කර හඳුනා ගැනීමට ක්‍රමයක් ලියන්න. (D - ඩියුටීරියම්)

(iii) $NO_3^-$ අයන ජලීය ද්‍රාවණයකට $Al$ කුඩු සහ ජලීය $NaOH$ ද්‍රාවණයක් එක්කර රත්කරන ලදී. මෙහිදී $NH_3(g)$ වායුව සහ $AlO_2^-$ අයනය සෑදේ යැයි නිරීක්ෂණය කර ඇත.

i. ඔක්සිකරණ අර්ධ ප්‍රතික්‍රියාව ලියන්න.

...................................................................................................................................................

ii. ඔක්සිහරණ අර්ධ ප්‍රතික්‍රියාව ලියන්න.

...................................................................................................................................................

iii. තුලිත අයනික සමීකරණය ලියන්න.

...................................................................................................................................................

(03) (a) $298\ K$ අයන කිහිපයක සජලන එන්තැල්පි අගයන් පහත දක්වා ඇත.

| අයනය | $\Delta H^{\theta}_{hyd}\ /\ kJmol^{-1}$ |
|---|---|
| $K^+\ (aq)$ | -305 |
| $Br^-\ (aq)$ | -351 |
| $Li^+\ (aq)$ | -499 |
| $F^-\ (aq)$ | -457 |

$KBr(s)$ සහ $LiF(s)$හි සම්මත දැලිස් එන්තැල්පිය පිළිවෙලින් $668\ kJmol^{-1}$ සහ $1008\ kJmol^{-1}$ වේ.

i. සම්මත ද්‍රාවණ එන්තැල්පිය අර්ථ දක්වන්න.

ii. පහත සම්මත ද්‍රාවණ එන්තැල්පීන්ට අදාළ තුලිතරසායනික සමීකරණ ලියන්න.

$KBr(s)$ ...................................................................................................................................................

$LiF(s)$ ...................................................................................................................................................

iii. ඉහත තාප රසායනික දත්ත යොදාගෙන $KBr(s)$ හි සමම්ත ද්‍රාවණ එන්තැල්පිය සෙවීමට සුදුසු තාප රසායනික චක්‍රයක් ගොඩනගන්න.

iv. ඉහත දත්ත යොදාගෙන $KBr(s)$ හි $\Delta H^{\theta}_{dissolution}$ (සමම්ත ද්‍රාවණ එන්තැල්පිය) ගණනය කරන්න.
..........................................................................................................................................
..........................................................................................................................................
..........................................................................................................................................
..........................................................................................................................................
..........................................................................................................................................
..........................................................................................................................................

v. ඉහත තාප රසායනික දත්ත යොදාගෙන $LiF\ (s)$ හි සම්මත ද්‍රාවණ එන්තැල්පිය සෙවීමට සුදුසු තාප රසායනික චක්‍රයක් ගොඩනගන්න.

vi. ඉහත දත්ත යොදාගෙන $LiF(s)$ හි $\Delta H^{\theta}_{dissolution}$ (සමම්ත ද්‍රාවණ එන්තැල්පිය) ගණනය කරන්න
..........................................................................................................................................
..........................................................................................................................................
..........................................................................................................................................
..........................................................................................................................................
..........................................................................................................................................

(b) I. 298 $K$ දී ප්‍රභේද කිහිපයක සම්මත මවුලීය එන්ට්‍රොපි අගයන් පහත වගුවේ දක්වා ඇත.

| ප්‍රභේදය | $S^{\theta}_{m}\ /\ JK^{-1}mol^{-1}$ |
|---|---|
| $KBr\ (s)$ | +95.9 |
| $LiF\ (s)$ | +35.9 |
| $K^{+}\ (aq)$ | +102.5 |
| $Br^{-}\ (aq)$ | +82.4 |
| $Li^{+}\ (aq)$ | +13.4 |
| $F^{-}\ (aq)$ | -13.8 |

i. $KBr(s)$ ද්‍රවණය වීමට අදාල සම්මත එන්ට්‍රොපි විපර්යාසය ගණනය කරන්න.

ii. $LiF(s)$ ද්‍රවණයවීමට අදාල සම්මත එන්ට්‍රොපි විපර්යාසය ගණනය කරන්න.

II i. $\Delta G$ , $\Delta H$ සහ $\Delta S$ අතර සම්බන්ධතාවය දැක්වෙන සමීකරණය ලියන්න.

ii. $KBr(s)$ ද්‍රාවණය වීමට අදාලව $298\,K$ දී $\Delta G^{\theta}$ ගණනය කරන්න.

iii. $LiF\ (s)$ ද්‍රාවණය වීමට අදාලව $298\,K$ දී $\Delta G^{\theta}$ ගණනය කරන්න.

iv. $KBr(s)$ හා $LiF\ (s)$ හි ද්‍රාව්‍යතාවයන් හේතු සහිතව සසඳන්න. (ඉහත ii සහ iii කොටස් හි ලද පිළිතුරු උපයෝගි කර ගන්න. )

(04) (a) I. $A$ නම් හයිඩ්‍රොකාබනයේ $0.05\,mol\ O_2$ වායුව හමුවේ සම්පූර්ණ දහනයේ දී $CO_2(g)15.4\ g$ ද $H_2O\ (g)\ 5.4\ g$ ද ලැබුණි. හයිඩ්‍රොකාබනයේ අණුක සූත්‍රය සොයන්න. ($C = 12,\ H = 1,\ O = 16$)

II. X, Y හා Z යනු A හි ව්‍යුහ සමාවයවික 3කි. $X, Y, Z$ තුනම ප්‍රකාශ සක්‍රිය වේ. Y සහ Z පමණක් Na සමඟ $H_2$ වායුව පිට කරයි. $X, Y$ සහ $Z$ , $HgSO_4(aq)/$ තනුක $H_2SO_4$ හමුවේ කාබනීල් සංයෝග ලබා දේ. $Z$ මගින් ලබාදෙන කාබනිල් සතුව $\alpha$ හයිඩ්‍රජන් 4ක් ඇත. ( $\alpha$ හයිඩ්‍රජන් යනු කාබනීල් $C$ පරමාණුවට බැඳි $C$ පරමාණුවකට බැඳි , ඇති $H$ ය. කාබනීල් කාබන් යනු  වේ.)

X, Y හා Z $Ni/H_2$ සමඟ ප්‍රතික්‍රියාවෙන් එකම D සංයෝගය ලබා දේ. D ද ප්‍රකාශ සමාවයවිකතාවය දක්වයි.

i. $X, Y, Z$ සහ $D$ හඳුනාගෙන $X, Y, Z$ සහ $D$ හි ව්‍යුහයන් පහත කොටුතුල අඳින්න.

| X | Y | Z | D |
|---|---|---|---|
| | | | |

ii. $X, Y, Z$ තනුක $HgSO_4(aq)/$ තනුක $H_2SO_4$ සමඟ ප්‍රතික්‍රියාවෙන් ලැබෙන ඵල ලියන්න.

$X \xrightarrow[60^0C]{HgSO_4 / \text{තනුක} H_2SO_4}$ [ ]

$Y \xrightarrow[60^0C]{HgSO_4 / \text{තනුක} H_2SO_4}$ [ ]

$Z \xrightarrow[60^0C]{HgSO_4 / \text{තනුක} H_2SO_4}$ [ ]

ii. ඉහත $(i)$ කොටසෙහි සඳහන් $Z$ ගෙන් ආරම්භ කරමින් ඉහත ප්‍රතික්‍රියා අනුක්‍රමණය සම්පූර්ණ කරන්න.

$Z \xrightarrow[\text{ක්විනොලීන්}]{H_2 / Pd / BaSO_4}$ [ ] $\xrightarrow{HBr / \text{පෙරොක්සයිඩ්}}$ [ ]

b. පහත දී ඇති ප්‍රතික්‍රියාවල දී ලැබෙන ප්‍රධාන ඵලයෙහි ව්‍යුහය සහ ප්‍රතික්‍රියාවර්ගය $A_N$ , $A_E$ , $S_N$ , $S_E$ , $E$ සහ $O$ යන ඒවායින් තෝරා අදාළ කොටුව තුළ සඳහන් කරන්න.

$A_N$ - නියුක්ලියෝෆිලික ආකලන
$A_E$ - ඉලෙක්ට්‍රෝෆිලික ආකලන
$S_N$ - නියුක්ලියෝෆිලික ආදේශ
$S_E$ - ඉලෙක්ට්‍රෝෆිලික ආදේශ
E - ඉවත්වීම
$O$ - ඔක්සිකරණ

| Reactant | Reagent | Major Product | Type of Reaction |
|---|---|---|---|
| $C_2H_5CH=CHCH_3$ | $Br_2/CCl_4$ | | |
| $CH_3CH_2\text{-}CH(CH_3)\text{-}OH$ | $PCl_5$ | | |
| $CH_3CH_2CH_2CH(OH)\text{-}CH_3$ | නිර්ජලීය $Al_2O_3/\Delta$ | | |
|  | $CH_3Cl$ / නිර්ජලීය $AlCl_3$ | | |
|  | $H^+/KMnO_4$ | | |

**රසායන විද්‍යාව - 2018 - 12 ශ්‍රේණිය (තෙවන වාර පරීක්ෂණය)**
**B - කොටස - රචනා**
**● මෙම කොටසින් ප්‍රශ්න දෙකකට පිළිතුරු සපයන්න.**

(05) (a) I i.) චාල්ස් නියමය ලියා දක්වන්න.
ii) පරිපූර්ණ වායු සමීකරණය ඇසුරෙන් චාල්ස් නියමය ව්‍යුත්පන්න කරන්න.

(b) පරිමාව $4{\cdot}157\ dm^3$ වන $A$ දෘඪ බඳුන තුල $227^0C$ හා $1.5 \times 10^5$ Pa පීඩනයක $CH_4\,(g)$ අඩංගු වේ. $B$ නම් තවත් දෘඪ බඳුනක් තුල $2.0 \times 10^5$ Pa පීඩනයක් යටතේ සහ $27^0C$ ක උෂ්ණත්වයක $O_2(g)\ 1.0\ mol$ අඩංගු වේ.
මෙම බඳුන් දෙක කරාමයක් සහිත පරිමාව නොගිනිය හැකි නලයකින් සම්බන්ධ කර ඇති අතර ආරම්භයේ දී කරාමය වසා ඇත.

I i) A බඳුනෙහි අඩංගු $CH_4(g)$ මවුල ගණන
ii) B බඳුනෙහි පරිමාව

II කරාමය විවෘත කර සමස්ත පද්ධතියේ උෂ්ණත්වය $27^0C$ ට ගෙන එන ලදී. මෙවිට $CH_4(g)$ වායුව $O_2(g)$ එකිනෙක අතර ප්‍රතික්‍රියාවක් සිදුනොවේ.
මෙම අවස්ථාවට අදාලව පහත දෑ ගණනය කරන්න.
i) පද්ධතියේ මුලු පීඩනය
ii) $CH_4(g)$ හා $O_2(g)$ මවුල භාග
iii) $CH_4(g)$ හා $O_2(g)$ හි ආංශික පීඩන
iv) $A$ බඳුන තුල ඇති වායු මවුල සංඛ්‍යාව

III ඉහත පද්ධතියේ කරාමය විවෘත කර සමස්ත පද්ධතියේ උෂ්ණත්වය $127^0C$ ට ගෙන ආ විට $CH_4(g)$ හා $O_2(g)$ තුල දහනය වී $CO_2(g)$ හා $H_2O(g)$ සාදයි.
මෙම අවස්ථාව සළකා පහත සඳහන් දෑ ගණනය කරන්න.
i) පද්ධතිය තුළ ඇති එක් එක් වායුන්ගේ මවුල සංඛ්‍යාව
ii) පද්ධතියේ ඇති මුලු වායු මවුල ගණන
iii) පද්ධතියේ මුලු පීඩනය
iv) පද්ධතියේ ඇති එක් එක් වායුන්ගේ මවුල භාග
v) පද්ධතිය තුල එක් එක් වායුන්ගේ අංශික පීඩන

IV ඉහත III කොටසේ දී ප්‍රතික්‍රියාව සිදුවී අවසන් වූ පසු සමස්ත පද්ධතියේ උෂ්ණත්වය $27^0C$ ට ගෙන එන ලදී. මෙම අවස්ථාවේ දී පද්ධතියේ මුලු පීඩනය ගණනය කරන්න.

(c) i.) වැන්ඩවාල්ස් වායු සමීකරණය ලියා එහි පද හඳුන්වන්න.
ii) තාත්වික වායු පරිපූර්ණ ත්ත්වයට ළඟා වන්නේ කුමන තත්වයටතේද? එයට හේතු පැහැදිලි කරන්න.
iii) නියත උෂ්ණත්වයේ දී $He,\ Ne,\ Ar$ වායුවල මැක්ස්වෙල් බෝල්ට්ස්මාන් ව්‍යාප්ති වක්‍ර එකම සටහනක අඳින්න.

(06)(a) (i) සම්මත දහන එන්තැල්පිය අර්ථ දක්වන්න.
(ii) සම්මත උත්පාදන එන්තැල්පිය අර්ථ දක්වන්න.

(b) $CH_3 - \overset{\overset{\displaystyle O}{\|}}{C} - H(g) + \frac{5}{2}O_2(g) \longrightarrow 2\,CO_2(g) + 2\,H_2O(g)$ යන ප්‍රතික්‍රියාව සළකන්න.

i) $298\,K$ දී පහත දී ඇති තාප රසායනික දත්ත භාවිතයෙන් ඉහත ප්‍රතික්‍රියාවේ සම්ම. එන්තැල්පි විපර්යාසය ගණනය කරන්න.

| බන්ධනය | සම්මත බන්ධන විසටන එන්තැල්පිය / $kJ\ mol^{-1}$ |
|---|---|
| $C - C$ | 348 |
| $C - H$ | 412 |
| $C = O$ | 743 |
| $O = O$ | 496 |
| $O - H$ | 463 |

ii) $298\,K$ දී ඇති පහත තාප රසායනික දත්ත භාවිතා කර ඉහත ප්‍රතික්‍රියාවේ සම්මත එන්තැල්පි විපර්යාසය ගණනය කරන්න.

| බන්ධනය | සම්මත උත්පාදන එන්තැල්පිය / $kJ\,mol^{-1}$ |
|---|---|
| $CH_3C(=O)-H(g)$ | -166 |
| $CO_2(g)$ | -394 |
| $H_2O\,(g)$ | -242 |

iii) ඉහත $(i)$ සහ $(ii)$ කොටස්වල දී ලද ප්‍රතික්‍රියාවේ එන්තැල්පි අගය එකිනෙකින් වෙනස් වන්නේ මන්දැයි යන්න කෙටියෙන් පැහැදිලි කරන්න.

(b) සම්මත අවස්ථාවේ දී බියුටේන් වායුව $(C_4H_{10}(g))$ $14.5\,g$ දහනයේ දී $722\,kJ$ තාපයක් මුදා හරියි. ප්‍රෝපීන් $(C_3H_6\,(g))$වායුව $2.1\,g$ දහනයේ දී $102.9\,kJ$ තාපයක් මුදා හරියි.
$(C = 12, H = 1, O = 16)$

(i) බියුටේන් හා ප්‍රොපීන් හි සම්මත දහන එන්තැල්පිය ගනනය කරන්න.
(ii) ඉහත එන්තැල්පීන් සමීකරණ මගින් දක්වන්න.
(iii) බියුටේන් හා ප්‍රොපීන් $1kg$ බැගින් දහනයේ දී පිටවන තාපයන් ගණනය කරන්න.
(iv) බියුටේන් හා ප්‍රොපීන් $1kg$ බැගින් දහනයේ දී පිටවන $CO_2(g)$ සකන්ධයන් ගණනය කරන්න.
(v) ඉහතදී ලද පිළිතුරු අනුව වඩාත් කාර්යක්ෂම ඉන්ධනය කවරේද යන්න හේතු සහිතව පැහැදිලි කරන්න.

(07) (a) වියළි පිරිසිදු $KIO_3$ 1.07 g නිවැරදිව කිරාගෙන එය අස්‍රැත ජලයේ දියකර $250.0\,cm^3$ ක ද්‍රාවණයක් සාදා ගන්නා ලදී. මෙම ද්‍රාවණයෙන් $25.0\,cm^3$ ගෙන එයට තනුක $H_2SO_4$ $5cm^3$ සහ වැඩිපුර $KI$ ද්‍රාවණයක් එක්කල විට නිදහස්වන $I_2$ සමඟ ප්‍රතික්‍රියා වීමට සාන්ද්‍රණය නොදන්නා $Na_2S_2O_3$ ද්‍රාවණයකින් $20.0\ cm^3$ වැය විය.

(i) ආම්ලික මාධ්‍යයේ $I^-$ හා $IO_3^-$ අතර ප්‍රතික්‍රියාවේ තුලිත අයනික සමීකරණය ලියන්න.
(ii) $I_2$ හා $S_3O_3^{2-}$ අතර ප්‍රතික්‍රියාවේ තුලිත අයනික සමීකරණය ලියන්න.
(iii) $Na_2S_2O_3$ ද්‍රාවණයේ සාන්ද්‍රණය ගණනය කරන්න.
(K = 39, I = 127, O = 16)

(b) (i) $NH_3$ හා $HCl$ සමඟ ජලයේ ප්‍රතික්‍රියා යොදාගනිමින් ජලයේ උභය ගුණී ස්වභාවය විස්තර කරන්න.

(ii) පහත අවස්ථාව සඳහා තුලිත රසායනික සමීකරණ ලියා දක්වන්න.

1. $NH_3$ ඔක්සිකාරකයක් ලෙස
2. $NH_3$ ඔක්සිහාරකයක් ලෙස
